www.AlevelApi.com



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

| | |
|---|---|
| දේශපාලන විද්‍යාව | II |
| அரசியல் விஞ்ஞானம் | II |
| Political Science | II |

23 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය.
* I කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, III කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. දේශපාලනය අධ්‍යයනය කිරීමේ දී භාවිත කරන තුලනාත්මක ප්‍රවේශය විස්තර කරන්න. (ලකුණු 20)
2. නූතන භෞමික රාජ්‍යය ප්‍රධාන අංග/මූලධර්ම හතරක් යටතේ සංවිධානය කර ඇත. ඒවා විස්තර කරන්න. (ලකුණු 20)
3. ලිබරල් ප්‍රජාතාන්ත්‍රික සහ සමාජවාදී රාජ්‍ය මාදිලි අතර ඇති වෙනස්කම් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

## II කොටස

4. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී වර්ධනයට ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ විසින් සිදුකරන ලද දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 20)
5. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි තිබූ වෙස්ට්මින්ස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතියට අයත් අංග කවරේදැයි විස්තර කරන්න. (ලකුණු 20)
6. 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පැවැති ව්‍යවස්ථාදායකය 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පැවැති ව්‍යවස්ථාදායකයෙන් වෙනස් වූයේ කෙසේදැයි විමසන්න. (ලකුණු 20)
7. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ ව පහත දක්වා ඇති මාතෘකාවලින් **දෙකක්** සාකච්ඡා කරන්න.
   (i) 13වන සංශෝධනයෙහි ප්‍රධාන ලක්ෂණ
   (ii) ජනමත විචාරණය පිළිබඳ විධිවිධාන
   (iii) ප්‍රංශයේ පස්වන සමූහාණ්ඩු ව්‍යවස්ථාව (1958) සහ ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ව්‍යවස්ථාව (1978) යටතේ ස්ථාපිත කරන ලද ජනාධිපති ක්‍රම අතර ඇති සමානතා (ලකුණු $10 \times 2 = 20$)

[දෙවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## III කොටස

**8.** ව්‍යවස්ථානුකූලවාදය සහ නීතියේ ආධිපත්‍යය ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සඳහා අදාළ වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 20)

**9.** වර්තමාන බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය එහි සාම්ප්‍රදායික ඒකීය මාදිලියෙන් ඈත් වී ඇති ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 20)

**10.** පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී දේශපාලන පක්ෂවල කාර්යභාරය

(ii) දේශපාලන ආයතන අධ්‍යයනය කිරීමේ වැදගත්කම

(iii) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂවල මෑතකාලීන ප්‍රවණතා

(iv) සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ලක්ෂණ

(v) ජාතික දේශපාලනය සහ ජාත්‍යන්තර දේශපාලනය අතර පවතින වෙනස්කම් (ලකුණු $10 \times 2 = 20$)

* * *

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .